

# සොඳුර මට සමු දෙන්න





යුගයෙන් යුගයට සමාජයක, ප්‍රජාවක ඇති වෙන අවශ්‍යතා එකී සමාජයේ, ප්‍රජාවේ හැදියාවට මුහු වෙන්නේ නිරායාසයෙන්. හැදියාවේ අංගයක් වෙන කලාව ඒ ඒ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටි අවස්ථා ලොව ඉතිහාසය දෙස නැඹුරු වී විමසුවහොත් වටහා ගත හැකියි. රුසියානු විප්ලවයට මැක්සිම් ගෝර්කි වියත් ලේඛකයාණන්ගේ 'අම්මා' කෘතිය බෙහෙවින් බල පෑ බව කියැවේ.

මව් බිමේ හැත්තෑව දශකය ඇඹෙන්නේ වෙනම ම ප්‍රබෝධයකින්. නව ජනරජයක සිතුවිලි ප්‍රමුදිතව මෝදු වෙන මේ වකවානුවේ නිර්මාණය වුණ කලා කෘතිවලින් ද ඒ පිබිදීම මොනවට පෙනී යයි. ප්‍රබුද්ධ පිරිසක් විසින් නිර්මාණය කරගෙන ආ මේ කලා නිර්මාණ අතරේ හෙළ ගීයට ද හිමි වූයේ මුල් තැනක්. කාලීන ප්‍රවණතාවයට නතු වූ පද නිබන්ධකයෝ මව් බිමේ දියුණ ගැන සිහින මවමින් සිය රචනා කළහ. විදෙස් රටවලට ණය නො වෙන, ස්වයංපෝෂිත මව් බිමක් වෙනුවෙන් ඔවුන් දුටු සිහින පද රචනා පුරා තැවරිණ.

කුමන ප්‍රවණතාවයක් හමුවේ වුව ද ප්‍රේමයට ද හිමි වෙන්නේ නො දෙවෙනි තැනක්. කලාකරුවෙකුට ඉන් මිදිය නො හේ. කලා රසිකයින්ගේ ද ඉල්ලුම එය ම වෙන නිසාවෙන් දෝ නිර්මාණකරුවෝ සිය දෑ හිත කාමී නිර්මණ අතරේ ද ප්‍රේමය ගැවසූහ. ඒ සිය නිර්මාණ රසිකයින් අතරට යවනා තවත් එක් ක්‍රමයක් වූ නිසාදැයි සිතෙයි. සිය නිර්මණය රසික සිත්වලට අලෙවි කර ගැනීමේ නියාවෙන් දැයි තවත් විටෙක සිතෙයි. ඒ කෙසේ වුව ද වසර 1971 දී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 'ප්‍රබුද්ධ ගී' වැඩසටහනක් වෙනුවෙන් නිර්මාණය වූ එවන් ගීයක් අදටත් රසික සිත් සතන් අතරේ දෝංකාරය දෙයි.

උදෑසනින් ම සිය පෙම්වතිය මුණ ගැසෙන මේ ප්‍රේමවනත්යා ඇයගෙන් අවසර අයැදින්නේ දුර ගම් පියසෙක ගොවිතැන් කරන්නට යන්නටයි. ස්ථාන මාරු ලබා දුරක ඇති සේවාස්ථානයක් කරා යන්න ට සැරසෙන තරුණයෙකු නො වේය මේ. දුර දුෂ්කර ප්‍රදේශවල ගොවි ජනපද ඇති කිරීම නිසාවෙන් ඒවායේ ඉඩම් ලද පිරිස් මෙලෙස සිය උපන් ගම් බිම් හැර දමා ගිය වකවානුවකි මේ. ගල්ඔය, පදවිය වැනි ජනපදවලට පසුව මහවැලි යෝජනා ක්‍රමය ටයතේ ද මෙලෙස ඉඩම් පවරා දීම් සිදු වූ වකවානුවක් පසු කලෙක උදා විය.

සිය ගමෙන් පිටත්ව දුර ගමකට යන තරුණයාගේ සවනත වැකෙනා කුරුළු ගී ඔහුට සිය පෙම්වතියගේ ආදර බස් වැනියි. දුරු පෙදෙසක සියයන්ගෙන් වෙන්ව දිවි ගෙවන මේ තරුණයාට කතරකි මේ නව පරිසරය. ලෙන්ගතුකම් දුරස් වී ගිය පරිසරයක ඔහුට ඇත්තේ ඒ වෙනුවෙන් පිපාසයක්. පෙම්වතියගෙ න් වෙන් වුන මේ පෙම්වතාට ආදරයේ සරතැසකි ඇත්තේ. ඒ සරතැස නිවාලිය හැක්කේ ඇයට පමණයි. ඒ වෙනුවෙන් මේ ඔහු අයැදින්නේ.

තමන්ගේ මතු නොව, මුලු රටේම අස්වනු පීදී, කරල් පැසී ජය ගන්නා දිනයක් එළැඹෙයි. එදාට මුළු රට ම ජය පැන් බොමින් සතුටින් ඉතිරී, ඉපිළී යනු ඇත. එවන් වසන්ත සමයක එළැඹෙන පුර සඳ පානේ මංගල මධු සමය ගෙවන්නටයි මේ පෙම්වතාගේ සිහිනය.

තමන් උපන් බිම සරු වූ දාකදීයි සැබැවින් ම සතුටු විය හැකි වෙන්නේ. එදාටයි සැනසිල්ලේ සිතු සේ තමන්ගේ ආදරයට නියම අරුතක් දෙමින් පෙම්වතිය සමඟ මුහු විය හැක්කේ මේ පෙම්වතාට.

මෙවන් ප්‍රබෝධමත් ප්‍රබුද්ධ අදහසක් පද පෙළකට කැටි කළේ දිවයිනේ ජ්‍යෙෂ්ඨ, ප්‍රවීණ ගී පද නිබන්ධකයෙකු වෙන සමන් චන්ද්‍රනාත් වීරසිංහයන්. හැත්තෑව-අසූව දශකවල රසික සිත් තුල සදා නො මියෙන ලෙස තැන්පත් ව¸ ගී රැසකම රචකයායි සමන් චන්ද්‍රනාත් වීරසිංහයන්.

පෙම්වතියගෙන් වෙන් ව යාමේ කණගාටුවත්, රට වෙනුවෙන් කැප වෙන්නට යාමේ උදාර සිතුවිල්ලත් මනා ලෙස කලතා වෙන ම ම අන්දමේ තනුවක් මේ පද රචනාව වෙනුවෙන් නිර්මාණය කළේ ආචාර්ය ප්‍රේමසිරි කේමදාසයන්. ගැමි සුවඳ වහනය වන සංගීත රටායෙන් ප්‍රමුදිත බව සිත්වලට කවමින් ප්‍රබෝධමත් කරවන්නට කේමදාසයන් ගත් ප්‍රයත්නය සදාකාලිකවම රැඳී තිබේ.

අහඹු සිදුවීමක් ලෙසින් ප්‍රේමසිරි කේමදාසයන් මේ ගීය ගැයුමට දායක කරගන්නේ එදා සංගීතය වැයීමට ගුවන් විදුලියට පැමිණි සිටි වාද්‍ය වෘන්දයේ සාමාජිකයෙකි. දිවයිනේ බිහි වූ අති විශිෂ්ඨ වයලීන වාදකයෙකු වන ඩී.ඩී ගුණසේනයන් ගැයූ මුල් ම ස්වතන්ත්‍ර ගීයයි මේ. තමන්ට ම අනන්‍ය වූ හඬකින් විසල් ස්වර පරාසයක ගැයීමේ හැකියාව ඇති ඩී.ඩී. ගුණසේනයන්ගේ ඒ හැකියාවන් උපරමයෙන් ම උකහා ගන්නට කේමදාසයන් මේ මුල් ගීයෙන් ම සමත් වෙයි.

අද වෙන විට ගායනයෙන් සම්මානීයයත්වයට පත් වුවද තවමත් වයලීනය අත නො හරින මේ ජ්‍යෙෂ්ඨ, ප්‍රවීණ ශිල්පියාණන් මෙල්බන් නුවර අප අතරේ රැඳී සිටීම ම මහත් සතුටක්. මේ සියළු දේ නිහඬව, සුහද සිනාවකින් නිහතමානීව විඳ දරා ගන්නා ඩී.ඩී. ගුණසේන ප්‍රවීන ගායන හා වාදන ශිල්පියාණන්ට නිරෝගී සුව සහ දීගායු පතමු.

**සොඳුර මට සමු දෙන්න - සමු දෙන්න**
**ඈත ගමේ සරු පස පෙරළන්නට**
**මා යනවා අද උදෑසනේ**

**ගමේ තුරු හිස් අතර පාවී**
**සවන වැකෙනා කුරුළු ගීතය**
**ඔබේ මුදු පිය වදන් වාගේ**
**නිවාලනු මැන මගේ සරතැස**

**අස්වනු පීදී - කරළින් බර වී**
**මුළු රට ඉතිරේ ජය පානේ**
**පුරහඳ පායන වසන්තයේ**
**අපි බොමු මංගල මධු පානේ**

*ගායනය:* ඩී.ඩී ගුණසේන
*සංගීතය:* අචාර්ය ප්‍රේමසිරි කේමදාස
*රචනය:* සමන් චන්ද්‍රනාත් වීරසිංහ